# ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය
# 2026 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම

**2026** වර්ෂය සඳහා පහත සඳහන් භාණ්ඩ සහ සේවා සැපයීම වෙනුවෙන් ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය සමඟ ලියාපදිංචි වීමට උනන්දුවක් දක්වන රජයේ දෙපාර්තමේන්තු, රජය සතු ව්‍යාපාර ආයතන, රාජ්‍යය සංස්ථා, පිළිගත් සැපයුම්කරුවන්, දේශීය නියෝජිතයින්, නිෂ්පාදකයින්, වෙළෙන්දන්, ව්‍යාපාර සංවිධානවලින් අයදුම්පත් කැඳවනු ලැබේ.

එක් එක් කාණ්ඩ වර්ගීකරණයන් සඳහා රු.1000/= ක ලියාපදිංචි ගාස්තු වෙන වෙනම ගෙවීමෙන් අයදුම්කරුවන්ට කාණ්ඩ එකකට හෝ එකකට වඩා වැඩි ගණනකට ඉල්ලුම් කල හැකිය. සෑම ඉල්ලුම්පතක් සමඟම නැවත ලබා නොදෙන රු.1000/= ක ලියාපදිංචි කිරීමේ ගාස්තුවක් මහජන බැංකුවේ (228 1001 9000 1704) දරණ' ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය' ගිණුමට බැර වන සේ ගෙවා ලබාගත් බැංකු රිසිට් පත හෝ ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ සරප් කවුන්ටරය වෙත ගෙවා ලබාගන්නා ලද රිසිට්පත එවිය යුතු වේ. බැංකු අණකර ය චෙක්පත් හෝ මුදල් ඇණවුම් භාරගනු නොලබන බව කරුණාවෙන් සලකන්න.

සැපයුම්කරුවන් හට ලියාපදිංචිවීමට අවස්ථාව සලසා දී ඇති අතර www.seu.ac.lk වෙබ් අඩවිය වෙත පිවිසීම මඟින් ඒ සඳහා ලියාපදිංචි විය හැක. සැපයුම්කරු විසින් තම අභිමතය පරිදි මෙහෙයුම් අයුරින් (manual) හෝ මාර්ගගත ක්‍රමය (online) ඔස්සේ ලියාපදිංචි විය හැක. ඒ අනුව, සැපයුම්කරු විසින් බැංකු රිසිට්පත ඇතුලු අදාල සහතික/ මුලික ලියවිලි ඉදිරිපත් කළ යුතුය. (සැපයුම්කරුවන් හට අදාල එම වෙබ් අඩවියට පිවිසීමෙන් අයදුම්පත භාගත හැක.)

ඕනෑම අයදුපතක් පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය විශ්වවිද්‍යාලය සතුවේ. යම් සැපයුම්කරුවෙකු ලන්සු කැඳවීම සිදුකරන ලද අඛණ්ඩ අවස්ථාවන් තුන (03) කදී ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වූවහොත් එම සැපයුම්කරුවන්ගේ නාමය **2026** වර්ෂයේ ලියාපදිංචි සැපයුම්කරුවන්ගේ නාමලේඛණයෙන් පූර්ව දැනුම්දීමකින් තොරව ඉවත් කරනු ලැබේ. සාමාන්‍යයෙන් භාණ්ඩ සහ සේවා සඳහා මිළ ගණන් කැඳවීම ලියාපදිංචි සැපයුම්කරුවන් වෙත සිදු කරන නමුත් අනෙකුත් තරඟකාරී සැපයුම්කරුවන්ගේ අවශ්‍ය අවස්ථාවන්හී දී මිළගණන් කැඳවීමේ අයිතිය විශ්වවිද්‍යාලය සතු වේ.

**2026** වර්ෂය සඳහා ලියාපදිංචි වූ සැපයුම්කරුවන් විසින් දින 45 ක අවම ණය පහසුකම් කාලයක් ලබාදීමට එකඟ විය යුතුය. යම් සැපයුම්කරුවකු ඉහත සඳහන් කොන්දේසිය ලියාපදිංචිවීමෙන් පසුව හෝ කඩ කරයි නම් එම සැපයුම්කරුගේ අදාල ලංසුව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක්, මෑත කාලීනව දේශීය ආදායම් කොමසාරිස්වරයා විසින් සහතික කල එකතු කල අගයමත බදු (VAT) සඳහා ලියාපදිංචි වීමේ සහතිකයේ පිටපතක් (VAT සඳහා ලියාපදිංචි වී ඇති සැපයුම්කරුවෙකු නම්), සහ අනෙකුත් අදාල ලියකියවිලි අයදුම්පත සමඟ අමුණා එවිය යුතුය. ඉහත සඳහන් සහතිකපත් ඉදිරිපත් කිරීමට අපොහොසත්වන අයදුම්කරුවන්ගේ අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. සෑම අයදුම්කරුවෙකුම තම ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ සහතිකයේ සඳහන් කර ඇති ව්‍යාපාර කටයුත්ත සඳහා අදාල වන භාණ්ඩ සහ සේවා සැපයුම් කිරීම සඳහා පමණක් ලියාපදිංචි වීමට අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අතර ඊට පටහැනිව ඉදිරිපත් කරන ලද අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

මාර්ගගත ක්‍රමය ඔස්සේ ලියාපදිංචි වීමට අපේක්ෂාකරන සැපයුම්කරුවන් විසින් එසේ ලියාපදිංචි වීමෙන් අනතුරුව, ඔවුන්ගේ මනාපය පරිදි මුලික අයදුම්පතේ සහ ඉහත සඳහන් සහතිකවල ඡායා පිටපත් ඉතා ඉක්මණින් විශ්වවිද්‍යාලය වෙත එවීමට කටයුතු කළ යුතු අතර මාර්ගගත ක්‍රමය ඔස්සේ ලියාපදිංචි වීම සඳහා වන අවසාන දිනය වනුයේ **2026.01.20** දින වේ. ක්‍රමය

සියලුම අයදුම්පත් අයදුම්පත් බාහලන ලියුම් කවරයේ වම්පස ඉහල කෙළවරේ "සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - **2026**"ලෙස සඳහන් කර සහකාර මුල්‍යාධිකාරී, සැපයුම් අංශය, ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය, විශ්වවිද්‍යාල උද්‍යානය, ඔලුවිල් # 32360 යන ලිපිනයට **2026.01.20** දිනට හෝ ඊට පෙර ලැබෙන පරිදි ලියාපදිංචි තැපැලෙන් හෝ සැපයුම් අංශය වෙත පැමිණ භාර දිය යුතුය.

මේ පිලිබඳ වැඩි විස්තර 067-2255178/067-2255001 යන දුරකථන අංක ඔස්සේ සම්බන්ධවීමෙන් ලබා ගත හැක.

ලේඛකාධිකාරී
ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය
විශ්වවිද්‍යාල උද්‍යානය, ඔලුවිල් # 32360